සබරගමුව පළාත් සභාව - சப்ரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாச்சார நடவடிக்கைகளுக்கான அமைச்சு

Ministry of Education, Information Technology & Cultural Affairs

Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

PMoE Sabaragamuwa

අමාත්‍යාංශ ලේකම් / Secretary – Office – 045 2223015

කාර්යාලය / Office – නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

මගේ අංකය / எனது இல / My Number – ME/E/11/08/2-1වෙළුම

ඔබේ අංකය / உமது இல / Your Number –

දිනය / திகதி / Date – 2023/04/27

---

සබරගමුව,පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,රත්නපුර/බලන්ගොඩ,

ඇඹිලිපිටිය/නිවිතිගල/කෑගල්ල/මාවනැල්ල/දෙහිඕවිට,

කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා සියළුම විදුහල්පතිවරුන්,

**සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන විදුහල්හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් සියළුම ආයතන වල අනධ්‍යයන කාර්ය මණ්ඩල වල වාර්ෂික ස්ථාන මාරු-2021(2022)**

උක්ත කාරණය සම්බන්ධයෙන් වූ මගේ සමාංක හා 2022.08.15 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කළ 2021(2022) අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වාර්ෂික ස්ථාන මාරු නියෝග හා එම ලිපියේ සඳහන් කරුණු වලට ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. මෙම ස්ථාන මාරු යෝජනා සම්බන්ධව මා වෙත ඉදිරිපත් වූ කරුණු දැක්වීම පිළිබඳව අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වාර්ෂික ස්ථාන මාරු පරිපාටියේ 7 වගන්තිය අනුව වාර්ෂික ස්ථාන මාරු යෝජනා සහ අභියාචනා මණ්ඩල තීරණ මේ සමඟ ඉදිරිපත් කරමි.මෙමගින් සිදු කරනු ලැබූ සංශෝධනයන්ට යටත්ව ඉහත සඳහන් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයින් සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2022.08.15 දිනැති ලිපිය මගින් යෝජිත 2021(2022) වාර්ෂික ස්ථාන මාරු නියෝග මෙයින් අනුමත කරමි.

03. ඉහත සඳහන් නියමයන්ට යටත්ව,ස්ථාන මාරු ක්‍රියාත්මක වන දිනය පිළිබඳව වෙනත් දිනයන් සඳහන් කර නොමැති සියළුම ස්ථාන මාරුවීම් 2023.05.03 දින සිට ක්‍රියාත්මක වේ.ඒ අනුව අනුප්‍රාප්තිකයන් සේවයට වාර්තා කරන තෙක් නොසිට ස්ථාන මාරුවීම් වලට යටත් සියළුම සේවකයන් අදාළ දිනයේ නව සේවා ස්ථාන වල රාජකාරි භාර ගැනීමට හැකිවන සේ වර්තමාන සේවා ස්ථානයෙන් 2023.05.02 දින සේවයෙන් පසු මුදාහැරීමට කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

04. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි ස්ථාන මාරු ලැබූ සේවකයෙකු නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවක දී එම සේවකයා ස්ථාන මාරුව ලබා ඇති සේවා ස්ථානයේ ප්‍රධානියා විසින් ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 7 වගන්තිය අනුව සේවය හැරයාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

සුජානි ආර්.විජේතුංග

ලේකම්

අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා

සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

සුජානි ආර්. විජේතුංග
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ සහ
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය රත්නපුර